
සිළුමිණ The Silumina
වර්ෂ 2012 ක්‍රි.ව ජූලි මස 22 වැනිදා ඉරිදා
ශ්‍රී බුද්ධ වර්ෂ 2556 ක්‍රි.ව කටක 07 ඇසල මස පුර තියවක ලත් ඉරිදා

කර්තෘට ලියන්න | මුද්‍රණය සඳහා

රාමා, සීතා, රාවණා සහ හනුමාන් සොයා ඉතිහාසයට ගිය ගමනක් - 10

# හනුමාන් ගෙනා ඔසු වනය රූමස්සල




රාවණාගේ ලංකාපුරය පිහිටියේ හම්බන්තොට මුහුද ආසන්නයේ මහා රාවණා කොටුව සහ කුඩා රාවණා කොටුව නමින් හැඳින්වෙන මුහුදු බාදනයට ලක්ව මුහුදට යටව පවතින සුවිශාල භූමි භාගයක බව මීට ඉහත ලිපියකින් අනාවරණය කළෙමි. එසේ අනාවරණය කළේ කිසිදු ඓතිහාසික සාක්ෂියක් පදනම් කරගෙන නොවේ. ජනවහරේ පැවත එන ජනකතා ආශ්‍රය කරගෙනය.

එසේනම් රාවණාගේ රාජධානියේ පිහිටි සියලුම අංග මුහුදට යටව පවතී. නැතිනම් මුහුදු බාදනයට ලක්ව විනාශ වී ගොස්ය.

ලංකාපුරය පිහිටියේ රාවණා කොටු දෙක ආශ්‍රිතව බව ඔප්පු කෙරෙන සාක්ෂියක් ගාල්ල නගරයේ මුහුද ආශ්‍රිතව පිහිටි රූමස්සල කන්දෙන් සපයා ගත හැකිදැයි විමසා බැලිය යුතුය. රූමස්සල කන්ද නමින් හැඳින්වෙන්නේ ගාල්ල නගරයට නුදුරින් ගාල්ල - මාතර මහාමාර්ගය පදනම් කරගෙන කිලෝමීටර් දෙකක් පමණ දුරින් පිහිටි කඳු පර්වත සහිත වනාන්තර භූමියකි. සුවිශාල තැනිතලා බිමකට නෑකම් කියන ගාලු දිස්ත්‍රික්කයේ ගාල්ල නගරයට ආසන්නව මෙවන් කඳු වැටියක් පිහිටා තිබීම ඇදහිය නොහැකි කරුණක් බවයි ඇතැමුන් පවසන්නේ. කොටින්ම කිවහොත් රූමස්සල කන්ද එම ස්ථානයට ආගන්තුක කන්දකි.

lakViskam

"රූමස්සල" නමැති නාමය රූ-මස්-සල නමැති වචන තුනට කඩකොට විග්‍රහ කළ හැකි යයි ද අරුත් වශයෙන් එය "ලස්සන කන්ද" නමින් ව්‍යවහාර කළ හැකි යයි ද රූමස්සල "බොනවිස්ටා" යන නමින් ද හැඳින්වෙන අතර එහි අරුත නම් "ලස්සන භූමි භාගය" යන්න බව ද ඇතැමුන්ගේ මතයයි.

දිගටිව සහ සිහින්ව පිහිටි මෙම අසිරිමත් කුඩා කඳු වැටියේ පුරාම ඉතාම දුර්ලභ ගණයේ ඖෂධ වර්ග බොහොමයක්ම පවතින බව කියනු ලැබේ. මෙහි ඇති ඖෂධ වර්ග ගණන 150 ද ඉක්මවන බව විද්වත්හු පවසති. රූමස්සල කඳු වැටිය සම්බන්ධයෙන් ගෙතී ඇති ජනප්‍රවාද සංඛ්‍යාව ද සුළුපටු නොවේ. මෙම කඳු මුදුනේ පලතුරු ගස් ඇති අතර ඒවායේ ඉදුණු පලතුරු පවතී. විටෙක රූමස්සල කඳු වැටිය තරණය කරන්නෝ එහි අතරමං වෙති. එවිට එහි පවතින පලතුරු කෑවොත් ඔවුන්ට ඉදිරියට ගමන් කිරීමට ඇති මාර්ගය පෑදෙන බවත් යළිත් මංමුලා නොවන බවත් කියනු ලැබේ.

මෙම ජනකතාව නුවරඑළිය ප්‍රදේශයේ පවතින්නේ තරමක් වෙනස්වය. හග්ගල කඳු මුදුනේත් වලපනේ මහකුඩුගල කඳු මුදුනේත් පලතුරු උයන් පවතින අතර එහි යන කෙනෙකුට ඕනෑතරම් පලතුරු කෑ හැකිය. එහෙත් ආපසු යන විට ගෙන යා නොහැකිය. එසේ ගෙන යාමට උත්සාහ කරන අයට මඟ වරදී. තවදුරටත් එහි ඇති මංමුලාවැල් පෑගුනොත් ඔවුනට ද මඟ වරදී.




රූමස්සල කඳු වැටිය මෙම ස්ථානයට ආගන්තුකව ලැබුණු එකක් බව මෙහි ඉහතින් ද අපි පැවසුවෙමු. එසේ කියා ඈඟ බේරා ගන්නට ද නොහැකිය. රාමායනය අනාවරණය කරන තොරතුරු ආශ්‍රයෙන් රූමස්සල කන්ද ආගන්තුක එකක් බව සනාථ කර ගත හැකි නම් එය අප ලද ජයග්‍රහණයක් බව කිව යුතුය.

රාවණාගේ ලංකාපුරය හම්බන්තොට කුඩා රාවණා හා මහා රාවණා කොටු ආශ්‍රිතව පැවතියා නම් රූමත් සීතා පැහැරගෙන විත් සඟවා තැබීමේ පටන් යළිත් රාම සහ හනුමාන් ඇතුළු පිරිස සීතා සොයාගෙන ආපසු කැඳවාගෙන යාම දක්වා ද සියලු සිදුවීම්, සිදු වූයේ ද එම රාවණා කොටු ආශ්‍රිතව බව අප පිළිගත යුතුය. රාම සහ රාවණා අතර අති බිහිසුණු යුද්ධය පැවතියේ ද එහිදීමය.

රාමත් - රාවණාත් අතර බිහිසුණු යුද්ධයක් ඇති නොවී සඟවා තිබුතැනින් හනුමාන් සොයා ගත් සීතාත් කැටුව ආපසු දඹදිව බලා යන්නට රාමට හොඳටම ඉඩකඩ තිබුණි. සඟවා තිබූ තැනින් සොයා ගත් මොහොතේ හනුමාන් සීතාත් පිටේ තබාගෙන ආරක්ෂිතව එක පිම්මෙන්ම දඹදිවට පනින්නදැයි හනුමාන් සීතාගෙන් විමසුවේය. එය නිවට ක්‍රියාවක් බව කී සීතා සිය සැමියා වන රාමගේත් ඔහුගේ සොහොයුරු ලක්ෂමණගේත් බලපරාක්‍රමය දුෂ්ට රාවණාට පෙන්විය යුතු යයි කියා රාවණා සමඟ සටන් කොට ඔහු මරා දමා ආපසු පිටත්ව යාමට සූදානමින් රාම - ලක්ෂමණ සහ හමුදාව ගෙන එන්නැයි සීතා හනුමාන්ට අණ කළාය.

රාම - රාවණා අතර ප්‍රබල යුද්ධයක් ඇතිවීමට ප්‍රධාන හේතුව වූයේ සීතාගේ එම ප්‍රකාශයයි. යුද්ධයේ දී වරෙක රාවණාට අවාසි විය. තවත් වරෙක රාමට අවාසි විය. රාවණා යනු ද ඉතා බලසම්පන්න රජෙකි. දසිස් නම් වූ ඔහුට හිස් දහයක් ඇත. ඇත්ත වශයෙන්ම නම් හිස් දහයක් තිබුණා නොවේ. ශක්තිවන්ත මිනිසුන් දස දෙනෙකුගේ ශක්තිය හෙවත් ඇතෙකුගේ ප්‍රබල ශක්තිය රාවණාට තිබුණි.

රාම සහ ඔහුගේ වානර හමුදාව කොතරම් බලසම්පන්න වුවත් යුද්ධයේ එක් අවස්ථාවක දී රාවණා හා ඔහුගේ යක්ෂ ගෝත්‍රික හමුදාව ඉදිරියේ රාමත් ලක්ෂමණත් වානර හමුදාවෙන් බොහෝ පිරිසකුත් යුදබිම මැරී වැටුණහ. රාමගේ පක්ෂයට අන්ත පරාජයක් අත්වෙමින් පැවතිය දී රාමගේ හමුදාවේ බලවතෙකු වූ ජම්බුවාන්ට මහාවීර හනුමාන් පිළිබඳව සිහිපත් වෙයි.

මියගියවුන් නැවත ජීවත් කරවීමේ හෙවත් අමරණීය කරවීමේ ඖෂධ ගැන දන්නේ ජම්බුවාන්ය. එහෙත් එම ඖෂධ ඇත්තේ දඹදිවය. රැය පහන් වන්නට කලියෙන් එම ඖෂධ රැගෙන ඒමේ හැකියාව ඇත්තේ මහා වීර හනුමාන්ට පමණි. එසේ ඖෂධ ගෙනාවොත් ඒ ඖෂධ බලයෙන් රාම - ලක්ෂමණ පමණක් නොව මියගියවුන් බොහොමයකට යළි ප්‍රාණය ලබා දිය හැකිය.

එබැවින් අවශ්‍ය ඖෂධ පිළිබඳ උපදෙස් ලබාගත් හනුමාන් එක පිම්මෙන්ම දඹදිවට ගොස් එහි හිමාලය වනාන්තරයේ ඖෂධ උද්‍යානයට පිවිසෙයි.

අවාසනාවකි. මේ වන විට ගෙන යා යුතු ඖෂධවල නම් හනුමාන්ට අමතක වී ඇත. ඒවා මතක් කරමින් ඉන්නට කාලය ද නොවේ. රැය පහන් වන්නට මත්තෙන් ඖෂධත් රැගෙන යළි ලංකාපුරයට යා යුතුය. එසේනම් කළ යුතු එකම දේ ඖෂධ වනාන්තරය ගලවාගෙන අතේ හෝ පිටේ තබාගෙන ලංකාපුරයට

එක පිම්මෙන්ම පැනීමයි.

ඖෂධ වනාන්තරයේ ඒ-මේ අත සැරිසැරීමේ දී ප්‍රබල ඖෂධවල සුවඳ ආඝ්‍රණය වීමෙන් හනුමාන්ගේ බලය සහ ශක්තිය සිය දහස් ගුණයකින් වැඩි වර්ධනය විය. ලොකු හෝ කුඩා කර ගත හැකි හනුමාන්ගේ ශරීරයේ විශාලත්වය යොදුන් හැත්තෑවකි. හනුමාන් ඖෂධ වනාන්තරය ගලවා හිස පිට තබාගෙන ලංකාපුරයට එයි. එම ඖෂධ බලයෙන් රාම, ලක්ෂමණ සහ පිරිස නැවත ප්‍රාණය ලබති.

දැන් හනුමාන් ඖෂධ වනාන්තරය හිමාලයට ගෙන ගොස් එය තිබුණ තැන, තිබුණ අයුරින්ම පිහිටුවිය යුතුය. එසේ පිහිටුවීම සඳහා ගුවනින් රැගෙන යන මොහොතේ ඖෂධ වනාන්තරයෙන් කෑල්ලක් කැඩී මහ පොළව මත පතිත විය. එය පතිත වූයේ ගාල්ලේ මුහුද අද්දරටය. රූමස්සල කන්ද වූයේ එසේ පොළවට පතිත වූ ඖෂධ වනාන්තර කෑල්ලයි.

ඇත්ත වශයෙන්ම රූමස්සල කන්ද වැනි කන්දක් එම ස්ථානයේ පිහිටීම මවිතකර වුවත් එය එම ස්ථානයට ආගන්තුකව පැමිණි කන්දක් වුවත් දුර්ලභ ගණයේ ඖෂධ වර්ග 150 කට වැඩි ප්‍රමාණයක් එහි පැවතීමෙන් එය හනුමාන් ගෙන ගිය ඖෂධ වනාන්තරයෙන් කැඩී වැටුණ කෑල්ල ලෙස හඳුන්වන්නට ගැමියෝ පෙලඹුණාහ. රූමස්සල කන්ද පිළිබඳ ජනප්‍රවාදයේ සඳහන් වන්නේ එලෙසිනි.

මෙම සිද්ධිය රාවණාගේ ලංකාපුරය කුඩා හා මහා රාවණා කොටු බව සනාථ කරන්නට ප්‍රබල සාක්ෂියක් වනවාට අනුමානයක් නැත.

එසේ වුවද රූමස්සල කඳු වැටිය පිළිබඳ මෙවන් අදහසක් ද පළ වේ. රූමස්සල, දොලුගල සහ රිටිගල යනු දුර්ලභ ඖෂධ වර්ගවලින් සපිරි මෙරට පිහිටි ඔසු උයන්ය. මේවා ඉතා පුරාණයේ සිට පැවත එන බව පැවසේ. පුලතිසි නම් වූ ඉසිවරයකු ඉදිකළ ඔසු උයන් ලෙස ද සැලකේ. ඒ හැරෙන්නට හනුමාන් දඹදිව හිමාලය පර්වතයේ සිට ඖෂධ කන්දක් ඔසොවාගෙන පැමිණීමත් ඉන් කැඩුණු කෑල්ල මහ පොළව මත පතිතව රූමස්සල ඖෂධ කන්ද ඉදිවූ බවත් විශ්වාස කළ නොහැකි යයි ඇතැම්මු පවසති.

රාවණා රජුගේ රාක්ෂය හමුදාවේ ප්‍රබලතම සෙන්පතියෙකු හැඳින්වූයේ මාගර නමිනි. මාගර සෙන්පතියාගේ වාසභවනය වී ඇත්තේ රූමස්සල කඳු වැටියයි. ඔහු රාමගේ වානර හමුදාවෙන් විශාල පිරිසක් සමූල ඝාතනය කිරීමට සමත් විය.

සිය බල පරාක්‍රමයේ මහිමයෙන් මුළු තුන් ලොවම ජයග්‍රහණය කළ රාවණා රජු අති ප්‍රබල බලවන්තයෙකි. රාජ්‍ය ජයග්‍රහණය කිරීම ඔහුගේ විනෝදාංශය වී තිබුණි. එවන් ප්‍රබල රජෙකු සීතා දේවිය පැහැරගෙන විත් ගල් ගුහාවක සැඟවී යන ප්‍රකාශනය විශ්වාස කළ නොහැකි බව ඇතැම් විද්වතුන්ගේ මතයයි.

බොහෝ විට රාවණා රජතුමා භාවිත කළ භූගත නගර පද්ධතියක් පැවතියේ යයි ද ඒවා සම්බන්ධ කරමින් උමං පද්ධතියක් පැවතියේ යයි ද උමං කීපයක් සම්බන්ධ වන ස්ථානයන්හි මතුපිටින් රාවණා ඇල්ලේ පිහිටි රාවණා ගුහාව වැනි ගල් ගුහා තිබුණේ යයි ද ප්‍රකාශ වන තවත් මතයකි.

රාවණා රජු වාතය මඟින් ද, සූර්යාලෝකය මඟින් ද උඩු ගුවනේ ධාවනය කළ හැකි වාහන වර්ගයක් භාවිත කොට ඇත. එසේ වාතය මඟින් ධාවනය වූ රිය ගුවනට නැග්ගවීමටත් ගුවනේ සිට බැස්ස වීමටත් නතර කොට තැබීමටත් භාවිත කළ ස්ථානයකි වාරියපොළ නමින් ව්‍යවහාරයට පත්ව ඇත්තේ. වා + රිය + පොළ යනුවෙන් ග්‍රාම නාමය විසන්ධි කොට අර්ථය විමසීමේදී ඒ බැව් පැවසේ.

වාරියපොළ ශ්‍රී සුමංගල විහාරස්ථානය ඉදිකොට ඇත්තේ එසේ රථවාහන නතර කිරීමට පාවිච්චි කළ ගල් තලාව මුදුනේ බවට පළවෙන මතයක් ද පවතී. වයඹ පළාතේ කුරුණෑගල ආශ්‍රිතව පිහිටි රම්බොඩගල්ල ද රාම - රාවණා යුද්ධය හා ඈඳුණු ග්‍රාමයකි. එම බිහිසුණු යුද්ධයේ දී මියගියවුන්ගේ බෙලි ගොඩ ගැසූ ස්ථානය රම්බොඩගල්ල නමින් ප්‍රසිද්ධ විය.

**(තව කොටසක් ලබන සතියේ)**

ඡායාරූප හා සටහන

සිරිසේන දේවප්‍රිය

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
© 2012 සියලු හිමිකම් ඇවිරිණි.
ඔබගේ අදහස් හා යෝජනා අපි අගයන්නෙමු
webmanager@lakehouse.lk

Lak Viskam